# අපි අපේ වීරෝධාර රණවිරුවන් වෙනුවෙන්



ආදරණීය අම්මේ තාත්තේ අයියේ අක්කේ නංගියේ මල්ලියේ,

තිස් වසරකට ආසන්න අම්හිරි කාල වකවානුවක් පුරා කුරිරු ත්‍රස්තවාදයෙන් හෙම්බත්ව සිටි අපට හෙට දවසක් තිබුනේ නැතිතරම්. ඒත්..යුද්ධය ජිවිතයේ කොටසක් කරගෙන අපි ජීවත් වීමට පුරුදු වුනා. නමුත් සියල්ල වෙනස් වෙමින් අද මේ වනවිටන ඒ ශාපලත් ත්‍රස්තවාදය මුලිනුපුටා කර දැමීමට අද අප වීරෝධාර රණවිරුවන් දිවා රෑ නොබලා ඔවුන්ගේ මුලු ජීවිතයම කැප කර සිටිනව.ඔවුන් මෙසේ ජීවිත පරදුවට තබමින් අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව සටන් වැද සිටින්නේ ඔබටත් මටත් අහිමි වේයැයි සිතූ අපේ සුන්දර මාතෘ භූමිය රැක ගැනීමේ පරම පවිත්‍ර අරමුනින් නොවේද?.

එවන් වූ කැපකිරීමක් කල අපේම සහෝදර රණවිරුවන්ගෙන් සමහරක් අද තමන්ගේ දෑත් දෙපා අහිමිව අසරණව සිටිනු ඇසීමෙන් හා දැකීමෙන් හදවත උනුනොවන්නේ කාගේද? එය ඔබෙත් මගෙත් හදවතට ගෙනදෙන්නේ දරාගත නොහැකි වේදනාවක් නොවේද? ඔවුනට එසේ වුනේ මා ඔබ නිසා නොවේද? ඔබත් මාත් ඔවුන්ගේ ජීවිතයේ කොටස් කරුවන් නොවේද?

දෑත් දෙපා අහිමිවූ සෙන්පතියෙකුට එම අඩුව පිරීමැසීමට අපේ දෑත් දෙපා දිමෙන් නොහැකි වූවත් ඔවුන්ගේ දුක, ඔවුන් හා බෙදා ගැනීමට අප නිතරම සිටින බව ඔවුන්ට ඒත්තු ගැන්වීම නොවේද අපේ කෘතගුණ සැලකීම?

**දේශප්‍රේමී ශ්‍රීලාංකිකයිනි!!!!**

එදා රණබිමේදී සටන් වැදුනත් අද රණබිමට යාමට නොහැකිව එක් තැන්වී සිටින එහෙත්, හදවතින් සැමදා සටන් බිමේ සටන් වදින මේ මහා විරුවන්ට උපකාර කිරීමට අප තවමත් ප්‍රමාද නැත.

එහි මූලික පියවරක් වශයෙන් SPURNZ සංවිධානය ඔබගේ ආධාරය මගින් මේ වන විටත් දෙපා අහිමි වූ විරුවන් විසිදෙදෙනෙකුට කෘත්‍රිම පාද ලබා දුන් අතර මෙය තව දුරටත් ඉදිරියට කරගෙනයාමට ඔබ සැමගේ කාරුනික සහය අප රටට,මේ විරුවනට අවශ්‍යව ඇත.

රුපියල් 45,000 වැනි මුදලකට දෙපා අහිමිවූ මේ විරුවෙකුට පාදයක් ලබා ගත හැකි බව ඔබ නොදන්නවා විය හැකිය.ඔබට තනිව මෙම බැරපැන දැරීමට නොහැකි වූවත්, ඔබට හිතවත් තව කීපදෙනෙකු සමගින් මෙම සත්කාරයට දායක වීමෙන්, ඔබ නුදුටු ඔබේ සහෝදරයා හෙට දවසේ නැවතත් ඇවිදිනු ඇසීම, දැකීම, ඔබ සැමගේ හදවතට යම් සැනසුමක් ගෙන දෙනු නොඅනුමානය

**ඉතින් හිතවත, මිනිසත් කම හඳුනන ඔබටයි මේ ආයාචනය!!!**

ඔබ කැමති විරුවකු වෙනුවෙන් මෙම පරිත්‍යාගය කිරීමට හැකි අතර,ඒ සඳහා ඔබ අවශ්‍ය මූලික කටයුතු ඔබ වෙනුවෙන් සූදානම් කරදීමට අපි කැපවී සිටින්නෙමු.



මුහුද දෙබෑ කරන – අහස පොලෝ සිඹින...
රටට සෙනෙහෙ පුදන- ලෙයින් මසින් සැදුන....
සැබෑ පියෙකි දරු දහසකි...මුලු රටේම ලේ නෑයෙකි...
අපේ එකෙකි සිය දහසකි...මේ දරු හට මව් දහසකි...
යෞවනයේ මේ සගයා....අපෙන් එකෙකි මේ මිනිසා...........

"ඔවුන්ගේ අද දවස අපගේ හෙට දවස වෙනුවෙන් කැපකර එහෙත්, අද අසරනව සිටින ජාතියේ සැබෑ මුර දේවතාවුනට අපගේ උත්තමාචාරය පුදකරමු!!!!!



**විමසීම්:**

සුනිල් 8283362 සෑම් 8130655 සුනෙත් 6246583 නිරන්ජන් 5231987

මහින්ද 4144424 ගාමිනි 5801169 පල්පාගම 4101136 නිලක්ෂ 6204643.

**ශ්‍රීලංකාවේ සාමය එකමුතුව සහ මානව අයිතිවාසිකම් පිලිබඳ**

**නවසීලන්ත සංගමය.**